





42 වන පිටෙන්

අසුරා ගත හැකි වේ..

**නැවත භාවිතය (Reuse)**

අප විසින් එක් වරක් පමණක් භාවිත කර, ඉවත් කරන බොහෝ දේ යලි එක් වරක්වත් පාවිච්චි කළ හැකිය. අප වැඩිපුරම භාවිත කරන ප්ලාස්ටික් 'සිලි සිලී මලු මේ සඳහා හොඳම උදාහරණයයි. පාරිභෝගිකයින් සියලු දෙනාම වෙළඳ පළෙන් ලැබෙන 'සිලි සිලී මල්ල තව එක වරක් පාවිච්චි කළහොත් 'සිලි සිලී මලු නිෂ්පාදනය හරි අඩකින් අඩු වන බව ඔබ කල්පනා කර තිබේද?

**ප්‍රතිචක්‍රීකරණය (Recycle)**

කලින්ද සඳහන් කළ පරිදි ප්‍රතිචක්‍රීකරණය පෞද්ගලික මට්ටමෙන් කළ හැකි දෙයක් නොවේ. ඔබ පදිංචිව සිටින ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය මේ සඳහා යම්කිසි වැඩ පිළිවෙලක් සකස් කර තිබේනම්, ප්ලාස්ටික් අපද්‍රව්‍ය නිසි අයුරින් තෝරා, ඒවා එකතු කිරීම සඳහා යොදා ඇති වාහනවලට හෝ පිළිසකර කරනු ලබන ස්ථානයට භාර දීමෙන් ඔබගේ යුතුකම ඉටු කළ හැකිය.

**ඉවත් කිරීම (Remove)**

මෙතෙක් සිදුවී ඇති සහ සිදුවෙමින් පවතින, ප්ලාස්ටික් දුෂණය නිසා පරිසරයේ සෑම අස්සක් මුල්ලකම, දැන හෝ නොදැන ඉවත දමා ඇති ප්ලාස්ටික් බොහෝය.

මෙයට හොඳම උදාහරණයක් ලෙස සිරිපා වන්දනා සමයේදී මග දෙ පස එකතුවන ටොන් ගණනක ප්ලාස්ටික් අපද්‍රව්‍ය තොගය සඳහන් කළ හැකිය. යෝජිත පංච විධ පිවිසුමේ පස් වැන්න වනුයේ මෙසේ අත්හැර දමා තිබෙන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ආපසු එකතු කර ප්‍රතිචක්‍රීකරණය හෝ වෙනත් පරිසර හිතකාමී දෙයකට යෙදවීමයි. රටවල් කිහිපයකම, මෙවැනි ප්ලාස්ටික් අපද්‍රව්‍ය අච්චුවක බහා ඉහල උෂ්ණත්වයක් යටතේ අධික පීඩනයකට ලක් කර සකස්කර ගන්නා ගඩොල් වැනි ප්ලාස්ටික් කුට්ටි පස සෝදායාම වැළක්වීමේ බැම් සඳහාත්, මුහුදු කෑම වැලැක්වීම සඳහා යොදා ගැනීම පිළිබඳවත් සැලකිල්ල දක්වන බව පෙනේ. සෑම කෙනෙක්ම මෙම සරල පිවිසුම් අවංක වම අනුගමනය කළහොත් නුදුරු අනාගතයේදීම, මීට දශක පහකට පමණ ඉහතදී මනා සමතුලිත තාවයකින් යුක්තව තිබුණු ඒ සුන්දර වටපිටාව, අපට නැවතත් ලබාගත හැකිවනු ඇත. තවමත් මේ සඳහා ප්‍රමාද නැත. අප තවතවත් ප්‍රමාද වුවහොත්, මිනිසා විසින්ම අත්තනෝමතික ලෙස පරිහරණය කර පරිසරයට මුදාහැර තිබෙන ප්ලාස්ටික් දූෂක වලින්ම මිනිස් සංහතියේ දුර්භාග්‍යය උදාවනු නොඅනුමානය.

## 6. ප්ලාස්ටික් බෝතල් හොඳින් හඳුනා ගනිමු.

මෑතදී කරන ලද සමීක්ෂණයකට අනුව ලොව වැඩියෙන්ම භාවිත වන ප්ලාස්ටික් භාණ්ඩය ප්ලාස්ටික් බෝතල් බව හඳුනාගෙන තිබේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්ලාස්ටික් කර්මාන්ත සමාජය (The Society of Plastics Industry- SPI ).නම් ආයතනය මගින් ප්ලාස්ටික් භාණ්ඩ වර්ගීකරණය කිරීම සඳහා අංකන ක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙම වර්ගීකරණයට විවිධ ප්ලාස්ටික් වර්ග සඳහා භාවිත කරන රසායන ද්‍රව්‍යය පාදක කරගෙන තිබීම පාරිභෝගිකයින් දැනුවත් කිරීම සඳහා උපයෝගී කර ගත හැකිය. විශේෂයෙන්ම අප විසින් පාවිච්චි කරනු ලබන ප්ලාස්ටික් බෝතල් වල පතුළ, පිටතින් හොඳින් පරික්ෂා කළහොත් මෙම අංක ඔබට දැක ගත හැකිවේ. ප්‍රතිචක්‍රීකරණයට අදාළ එම අංක වලින් හැඳින්වෙන ප්ලාස්ටික් බෝතල් සහ වෙනත් භාණ්ඩ වල අඩංගු රසායන ද්‍රව්‍ය පිලිබඳ දනුවත් වීම සඳහා පහත දැක්වෙන සටහන ප්‍රයෝජනවත් වේ.

**1 PETE — අංක 01.PETE**
Polyethylene terephthalate

මෙම ප්ලාස්ටික් වර්ගය බෙහෙවින් භාවිත කරනුයේ සිසිල් බීම බෝතල්, මාජරින් බඳුන් වැනි දේ නිෂ්පාදනයේදීය, මේවා ප්‍රතිචක්‍රීකරණය කර කාපට්, කඹ, ලනු වැනි දේ සකස් කර ගත හැකිය.

**2 HDPE — අංක 02.HDPE**
High-density polyethylene

නැවුම් කිරි බොතල්, පවිත්‍ර කාරක ද්‍රාවණ බෝතල්, ලිහිස්සි තෙල් බෝතල් ආදිය සඳහා භාවිතා වේ. මල් පෝච්චි, කසල බඳුන්, මාර්ග අලුත්වැඩියා කිරීමේදී, වාහන බධක සලකුණු කිරීමේ කණු ආදිය සෑදීම පිණිස ප්‍රතීචක්‍රීකරණය කළ හැකිය.

**3 V — අංක 03.V(PVC)**
Poly Vinyl Chloride

ෂැම්පු බෝතල්, ආහාර පිසීමේ තෙල් බාහාලන බෝතල්, වෙළඳපලේ පිසූ ආහාර බහලුම් ආදිය සඳහා යොදා ගනු ලැබේ. මේවා ප්‍රතිචක්‍රීකරණය කර ජල නල, වාරි ජල සැපයුම් නල ආදිය සකස් කළ හැකිය.

**4 LDPE — අංක 04.LDPE**
Low-density polyethylene

'සිලි සිලි' මලු, පාන්, බනිස් වැනි බේකරි ආහාර දවටන, ආහාර එතීම සඳහා ගන්නා *Lunch sheets* ආදිය, *LDPE* ප්‍රතිචක්‍රීකරණය කර 'සිලි සිලි' මලු යලි නිපදවිය හැකි නමුත්, එවා අනෙකුත් ප්ලාස්ටික් වර්ග සමග මිශ්‍ර නොකර වෙනම එකතු කර ප්‍රතිචක්‍රීකරණය කිරීම වඩාත් ප්‍රවේශම් සහිතය.

**5 PP — අංක 05.PP**
Poly Propylene

බෝතල් මුඩි, කෘතිම දැව, යෝගට් බඳුන්, වාහන බැටරි ධාරක ආදිය නිෂ්පාධනය සඳහා උපයෝගී කර ගනු ලැබේ. එම දේවල්ම සකස් කිරීම පිණිස ප්‍රතිචක්‍රීකරණය කර ගත හැකිය.

**6 PS — අංක 06.PS**
Polystyrene

වරක් භාවිතයෙන් පසු ඉවත් කෙරෙන කෝප්ප, ඇසුරුම් සඳහා භාවිත කරන ද්‍රව්‍ය, මාංශමය ආහාර ගබඩා කරන ඇසුරුම්, රිජිෆෝම් ආදිය මෙම ගණයට වැටේ, මේවා ප්‍රතිචක්‍රීකරණය කර කෘතිම දැව, මල් පෝච්චි, කැසට් පටි පෙට්ටි ආදීය නිෂ්පාදනය කෙරේ.

**7 OTHER — අංක 07.OTHER**
වෙනත්

ප්ලාස්ටික් වර්ග කිහිපයක් මිශ්‍ර කර නිෂ්පාධිත භාණ්ඩ මෙම ගණයට ඇතුලත් වේ. අඩංගු දේ මීරිකා පිටතට ගත හැකි බෝතල්, මයික්‍රෝවේව් උඳුන් වල රත් කල හැකි 'පිඟන්' ආදිය මෙම භාණ්ඩ වේ. මේවායේ විවිධ රාසායන ද්‍රව්‍ය රාශියක් තිබෙන නිසා ප්‍රතිචක්‍රීකරණය නුවණට හුරු නොවේ.

### ප්ලාස්ටික් වර්ග හඳුනාගැනීම සහ අංක යොදා වර්ගීකරණය කිරීම

මේ ආකාරයට ප්ලාස්ටික් පිලිබඳ දැනුවත් වීමෙන්, එදිනෙදා ජිවිතයට අත්‍යාවශ්‍ය එම කෘතීම භාණ්ඩ හෝ දේවල් ක්‍රමානුකූලව භාවිත කර, කලට වේලාවට ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමෙන් පරිසර හානිය අවම කර හත හැකි වනු ඇත. ස්වාභාවික පරිසරය ගැන හොඳින් සිතා බලන විට 'ඉවත දැමීම' ('throwing away') යන්න අප විසින්ම යොදා ගන්නා වචන මාත්‍රයක් පමණක් මිස, ඇත්ත වශයෙන්ම 'ඉවත' නමින් හැඳින්විය හැකි ස්ථානයක් නොමැතිය. අප 'ඉවත' ලෙස සිතා සිටින සෑම ස්ථානයක්ම පියවි ඇසට පෙනෙන හෝ නොපෙනෙන වෙනත් ජීවින් රාශියකගේ වාසස්ථානය විය හැකිය! 2018 වසරේ මිහිකත සුරැකීමේ තේමාව ලෙස 'ප්ලාස්ටික් මගින් සිදුවන පරිසර දුෂණයට තිත තබමු' (Getting Rid of Plastic Pollution) යන්න පිළබඳව අප කවුරුත් එකිනෙකාගේ යුතුකම ඉටුකර ප්ලාස්ටික් භාණ්ඩ, අනතුරු දායක ලෙසට පරිහරණය නොකර හැකිතරම් දුරට ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා වැඩි වැඩියෙන් සිත් යොමු කර, අනාගතයේදීත් මිනිසාට ජීවත්වීමට හිතකර, සුන්දර ලොවක් අත්කර දීමට අදිටන් කර ගනිමු. (New York State Department of Environmental Conservation විසින් අන්තර් ජාලයේ පළකර ඇති තොරතුරු ඇසුරෙනි.)